සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# කැලණිය අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය 2016

## 10 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

නම/විභාග අංකය ---------------------------------------------------------------------------------------- කාලය පැය 1

නියමිත ලකුණු ප්‍රමාණය 40 කි.

- අංක 01 සිට 03 තෙක් ඇති එක් එක් වාක්‍යයෙහි යටින් ඉරි ඇඳ කොටසේ අදහසට වඩාත් සමීප අදහස තෝරන්න.

01. පැන ගිය සොර මුළ සොයා පොලිසිය නගරය දෙවනත් කළේය.
(1) ඔත්තු බැලීම (2) ආරක්ෂාව තර කළේ ය
(3) මැනවින් සොයා බැලිය (4) තර්ජනය කළේ ය.

02. වාරි තාක්ෂණයේ හර පද්ධතියක් ලෙස 'සැමට ජලය' ලබාදීමේ ක්‍රම ශිල්පය නම් කළ හැකිය.
(1) වටිනාකම් සමූහයක් (2) වාරිමාර්ග පද්ධතියක්
(3) ජලහරණයක් (4) ජල මාර්ග ජාලයක්

03. පොල් වගාවේ සාර්ථකත්වයට පාරිසරික සාධක අත්‍යවශ්‍ය වේ.
(1) පරිහරණයවන (2) පරිසරයට අයත්
(3) පරිභෝජනය කරන (4) පාරිභෝගිකයන්ට මුදිත

- අංක 4 සිට 07 තෙක් එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අදහසට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.

04. තමා මුරුංගා අත්තේ තැබීම ගැන ආයතන ප්‍රධානියා අප්‍රසාදය පළ කළේය.
(1) අනවශ්‍ය ලෙස වාර්තා කිරීම (2) උසස් තනතුරකට පත් කිරීම
(3) අවදානම් තැනක තැබීම (4) නොමනා කටයුත්තකට යොමු කිරීම

05. අන් අයගේ වැඩ කටයුතුවලට අකුල් හෙළීම අතැමෙකුගේ සිරිතකි.
(1) කැලෑ එළිකිරීම (2) එකට එක කිරීම
(3) බාධා කිරීම (4) අනුබල දීම

06. තොරතෝංචියක් නැතිව ඇසෙන කුරුළු නාදය පරිසරයේ නිහඬතාව බිඳ දැම්මේය.
(1) වෙන්කොට හඳුනා ගත නොහැකි සේ (2) තේරීමකින් තොරව
(3) කෝලාහලයක් සේ (4) දිගින් දිගටම පැවතෙන

07. ඔහු මෙ දිනවල වැලේ වැල් නැතිව කල්පනා කරමින් සිටියි.
(1) බලවත් ලෙස රෝගාතුර වී (2) යාචකයෙකු බවට පත් වී
(3) දැඩි ආර්ථික අපහසුතාවට පත් වී (4) ගැටලු සහගත තත්ත්වයට පත් වී

- අංක 08 සිට 121 තෙක් ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැන් සඳහා වඩාත් සුදුසු පදය තෝරන්න.

08. ශ්‍රී ලංකාවේ විසිතුරු භාණ්ඩවලට වර්තමානයේ හොඳ විදේශ -----------පවතී.
(1) ඉල්ලීමක් (2) සංචිතයක් (3) බලපෑමක් (4) ඉල්ලුමක්

09. සාහිත්‍ය නිර්මාණයක් බිහිවන්නේ සාහිත්‍යකරුවා තුළ පවත්න ---------------- ශක්තිය නිසා ය.

(1) චින්තන (2) ශරීර (3) කල්පනා (4) ප්‍රතිභා

10. රසවින්දනයට අදාළ සහජ ශක්තිය ---------- ගුණය නම් වේ.

(1) අන් (2) වාසනා (3) කාල (4) සන්

11. ---------------බොරු නොකියති යි සමහරු සිතති.

(1) මම (2) මවිසින් (3) මා (4) මම විසින්

- අංක 12 සිට 15 තෙක් දී ඇති එක් එක් වාක්‍යයේ ඉරි ඇඳි කොටසේ අදහස දෙන තනි පදය තෝරන්න.

12. කවියාගේ නිර්මාණයට පාදක වූ <u>අත්දැකීම</u> නිර්ව්‍යාජ ය.

(1) ප්‍රතිභාව (2) අනුභූතිය (3) ව්‍යුත්පත්තිය (4) ප්‍රඥාව

13. එම ආරංචිය ලද මොහොතේ ඔහුගේ සිත තුළ ඇති වූ <u>කනගාටුව</u> දැස් අග කඳුලින් වටහා ගත හැකි විය.

(1) සන්ත්‍රාසය (2) සන්තුෂ්ටිය (3) සන්තාපය (4) සන්නතිය

14. කවර සාහිත්‍යාංගයකින් වුව ද ඉදිරිපත් කෙරෙන අත්දැකීම් මඟින් සහෘදයාට <u>රස මුසු වින්දනයක්</u> ලබා දිය යුතුය.

(1) ආශ්චර්යයක් (2) රසාස්වාදයක්
(3) ඓශ්චර්යයක් (4) ප්‍රතිභාවක්

15. සුභාවිත සංගීතය රසවිඳීමේදී ශ්‍රාවකයා වෙත ගෙන එන <u>රසමුසු මිහිර</u> අන් කවරකින් වුව ද ලබාගත නොහැක.

(1) ප්‍රතිභාව (2) ආනන්දය
(3) විචාරය (4) පරිකල්පනය

- අංක 16 සිට 20 තෙක් ඇති එක් එක් පද යුගලයෙහි දෙවන පදය
(1) පළමුවැන්න අර්ථයෙන් සමාන වේද, පළමුවැන්නට අර්ථයෙන් විරුද්ධ වේද පළමුවැන්නේ අර්ථය වැඩි කරයි ද, පළමුවැන්න වෙනත් අර්ථයක් සහිත වේද යන්න තෝරන්න.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 16. | වර්ධනය -සංවර්ධනය | (1) | සමාන | (2) | විරුද්ධ | (3) | වැඩි | (4) | වෙනස් |
| 17. | උභය - යමක | (1) | සමාන | (2) | විරුද්ධ | (3) | වැඩි | (4) | වෙනස් |
| 18. | උපමාව - රූපකය | (1) | සමාන | (2) | විරුද්ධ | (3) | වැඩි | (4) | වෙනස් |
| 19. | විවෘත - සංවෘත | (1) | සමාන | (2) | විරුද්ධ | (3) | වැඩි | (4) | වෙනස් |
| 20. | හරිත - කොළ | (1) | සමාන | (2) | විරුද්ධ | (3) | වැඩි | (4) | වෙනස් |

- අංක 21 සිට 25 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයේ මුලින් යෙදී ඇති පදයේ නිවැරදි විග්‍රහය තෝරන්න.

21. මාර්ගෝපදේශ

(1) මාර්ගෝප + දේශ (2) මාර් + ගෝපදේශ
(3) මාර්ග + උපදේශ (4) මාර්ග + ප්‍රදේශ

22. උපනූපන්

(1) උපනු + පන් (2) උප + නූපන් (3) උපන් + නූපන් (4) උපන් + උපන්

23. විදේශාධාර

(1) විදේශා + ධාර (2) විදේශ + ආධාර (3) වි+ දේශාධාර (4) විදේශඃ + ආධාර

24. සුරත

(1) සුර් + අත (2) සුරා + අත (3) සුරු + අත (4) සුරඅ+ ත



papers.lk
PDFelement
Remove Watermark Now

Remove Watermark Now

25. දුප්පත්

(1) දුප්+ පත් (2) දුප්ප + අත් (3) දු + ප්පත් (4) දුක් + පත්

26. නිවැරදිව අකාරාදි පිළිවෙලට සකස් කර ඇති පද පේළිය තෝරන්න

(1) කුමාරගම, ගුණසිංහ, සේනානායක , මහගම සේකර
(2) ජනහඬ , දොරමඩලාව, පහන්දොර, රතුඉර
(3) වරකාපොළ, කතරගම, මන්නාරම, දඹුල්ල
(4) අමාවතුර, ධර්මප්‍රදීපිකාව, සද්ධර්මාලංකාරය, බුත්සරණ

27. ඇදය , පාපිල්ල, ගයනුකිත්ත, ඇලපිල්ල යන පිල්ලම් පිළිවෙලින් නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) නැහැය , රුදුරු, බෞද්ධ, ප්‍රසිද්ධ (2) පැහැය, ප්‍රබල, කාර්යය,සෞම්‍ය
(3) රැවුල, සෞඛ්‍යය, ක්‍රෑර, කුඩුව (4) කැටය, අවුල, ගෞරව, පාදය

28. මුලින් දී ඇති ව්‍යාකරණ ගණයට අයත් නොවන පදයක් ද සහිත පද පේළිය තෝරන්න.

(1) ක්‍රියා - කරවයි, කරවු, දිනේවා කරමින්
(2) නිපාත - මෙන්, සේ, වැනි, බඳු
(3) තද්ධිත - ගුණවත්, සිරිමත්, උත්තම, ප්‍රියතම
(4) සමාස - කිරිබත්, සොරබිය, දසබල, අනුබල

29. පහත සඳහන් වාක්‍ය අතුරෙන් සන්ධි පදයක් යෙදී නොමැති වාක්‍යය තෝරන්න.

(1) සාමය අගයන්නෝ නීත්‍යානුකූලව කටයුතු කරන්නෝ විය යුත්තාහ.
(2) විභාගය සමත් වීමට හොඳින් පාඩම් කිරීම අත්‍යවශ්‍යය.
(3) පාසල් දරුවන් ඔවුනොවුන් හඳුනාගත යුතුය.
(4) අපි සියලල්ලෝම ජාතියේ අභිමානය රැක ගනිමු.

30. පහත දී ඇති පද අතුරෙන් යුගල පදයක් ඇතුළත් නොවන පද පේළිය තෝරන්න.

(1) අණගුණ, සණ්ඩුසරුවල්, නඩුහබ, දෙපිටකාට්ටු
(2) ලට්ටලොට්ට , බඩුමුට්ටු, වාදභේද, කැපිලිකෙටිලි
(3) ගෙවල්දොරවල්, නහිනදෙහින, වට්ටිපෙට්ටි, කොල්ලොකුරුට්ටෝ
(4) ඉහින් කනින්, ලවක්දෙවක්, ඉඩම්කඩම්, ඔප්පුතිරප්පු

• අංක 31 සිට 35 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශයෙහි අදහසට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

31. "තමන් සතු දිය අනුන්නට දී වෙන කෙනෙකුගෙන් එය ලබා ගන්නට තැත් කිරීම "

(1) අත දීලා දත නියවීම (2) අත්තටු කපා පියාඹන්නට කීම
(3) අනුන්ගේ පානෙන් එළිය බැලීම (4) අනුන්ට හෑරුවලේ තමන්ම වැටීම

32. "වැඩි අලාභයක් අමතක කොට සුළු ලාභයක් තකා යමක් කිරීම "

(1) අටුවෙන් දුමට පැනීම (2) අටුව කඩා පුටුව සෑදීම
(3) අකු කඩා මොර කෑම (4) කෝදුව තියෙද්දි අතින් මැනීම

33. "කටයුතු කීපයක් සඳහා ගන්නා එකම දෙය"

(1) ගලේ කෙටූ අකුර (2) ගමරාළගේ තුවක්කුව
(3) ගමරාළගේ වංගෙඩිය (4) ගමරාළගේ වෙඩිල්ල

34. "තමන් නොකරන වැඩය අනුන්ටවත් කරන්නට නොදීම "

(1) බල්ලන්ට ලෙලිපොල් දීම (2) පිදුරු ගොඩේ බල්ලා වගෙයි
(3) බල්ලට කී දෙය බලු නගුටට කීම (4) බලුවලිගේ බැන්ද මීය වගෙයි

papers.lk
pdfelement

35. පමණ දැන ක්‍රියාවේ යෙදීම

| | | | |
|---|---|---|---|
| (1) | ඇඟිල්ලේ තරමට ඉදිමීම | (2) | යන්නේ කොහේද මල්ලෙ පොල් |
| (3) | ඇහැට ඇඟිල්ලෙන් ඇනීම | (4) | අතු කඩා මොර කෑම |

- අංක 36 සිට අංක 40 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි දී ඇති වාක්‍ය හරත අතුරෙන් ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.

36. (1) ගුරුවරුද ශිෂ්‍යයෝ ද අනාථ ආධාර එකතු කළහ.
(2) ගුරුවරුන්ද ශිෂ්‍යයෝද අනාථ ආධාර එකතු කළහ
(3) ගුරුවරුද ශිෂ්‍යයන් ද අනාථ ආධාර එකතු කළහ
(4) ගුරුවරුද ශිෂ්‍යයෝද අනාථ ආධාර එකතු කරනු ලැබූහ.

37. (1) මිතුරන් නිවසට පැමිණෙන යි අප විශ්වාස කෙළෙමු.
(2) මිතුරන් නිවසට පැමිණෙති යි අපගේ විශ්වාසය පළ කළෙමු
(3) මිතුරන් නිවසට පැමිණෙති යි අපි විශ්වාස කළෙමු
(4) මිතුරෝ නිවසට පැමිණෙතියි අපි විශ්වාස කෙරිණි.

38. (1) අප වැඩි දෙනෙක් කියවීමට රුචියක් දක්වමු
(2) ළමයි හෝ ඔබ හෝ මම හෝ එය ගත්තෙමු
(3) ගායකයෙක් ගායිකාවක හා වේදිකාවට පැමිණියහ
(4) සමහරුන් රණ ගී ගැයූ අතර ඇතැමෙක් තාලයට අනුව නැටූහ.

39. (1) පුතුණුවෝ පාඨමාලාව මැනවින් හදාරයි.
(2) දියණියෝ මවුපියන්ගේ ප්‍රසාදයට ලක්වූහ
(3) පියාත් පුතාත් කුඹුරු වපුරයි
(4) කුකුළන් හඬලද්දී මා අවදි වූයෙමි

40. (1) ලේඛකයෙකු වූ ඔහු දක්ෂ ගායකයෙකු ද විය
(2) මදුරුවන් රෝග බෝකරතියි වෛද්‍යවරුන් පවසති
(3) සේවකයෝ පාර කපද්දී මිනිස්සු එදෙස බලා සිටිති.
(4) මා උසස් ලෙස විභාගය සමත්වුණොත් අම්මා සතුටු වන්නීය.

සියලුම හිමිකම් ඇවිරිණි
All Righis Reserved

# කැලණිය අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය 2016

## 10 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය II

නම/විෂය අංකය -------------------------------------------------------------------------------- කාලය පැය 2

නියමිත ලකුණු ප්‍රමාණය 80 කි.

01. i-x **තෙක් ඇති සියලුම අනුකොටස් වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් ගසන්න.**

i. සිංහල හෝඩියේ ඇති පහත සඳහන් අක්ෂර උපදින ස්ථානය අනුව කවර වර්ගයට අයත්දැයි නම් කරන්න.
(අ) ප. එ, බ, භ, ම ---------------------------- (ආ) ත ථ ද ධ න ----------------------------

ii. පහත අක්ෂර වල ඇති පිල්ලම් නම් කරන්න.
(අ) ග්‍රන්ථ ---------------------------- (ආ) රුක ----------------------------

iii. පහත සඳහන් කතෘ කාරක වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.
(අ) ළමයි කූඩුවේ සිරකර සිටි කුරුල්ලන් නිදහස් කරති.
(ආ) විදුහල්පතිතුමිය නවක ශිෂ්‍යාවන් සාදරයෙන් පිළිගත්තාය.

iv. විසන්ධි කරන්න.
(අ) පිනැත්තෝ ---------------------------- (ආ) සියැසින් ----------------------------

v. තද කළු අකුරින් මුද්‍රිත ක්‍රියා පද වර්ගය නම් කරන්න.
මලින් මලේ රේණු **උරා** - බමන බමර සතර දිගන්තේ
රන් රසු ඇල් රාව **දිදී** - මවයි මිහිර මධුර වසන්තේ
(අ) ---------------------------- (ආ) ----------------------------

vi. උපමා උපමේය වෙන් කර ලියන්න.
බුද්ධ පූජාවට මල්දමක් ඇමුවා සේ පුතු බුදුන් හා ඇතු මැදට දමා
(අ) උපමාව ---------------------------- (ආ) උපමේය. ----------------------------

vii. පහත සඳහන් වචන අනුක්ත ස්වරූපයෙන් ලියන්න.
(අ) ධීවරයෝ ---------------------------- (ආ) නිළියක් ----------------------------

viii. පහත වාක්‍යාංශ සඳහා තනි පද ලියන්න.
(අ) නිරන්තරයෙන් අභ්‍යාසයේ යෙදීම
(ආ) අපූර්ව වස්තුවක් නිර්මාණය කිරීමේ හැකියාව

ix. "කිරි අල" හා 'ගස්ලබු ' සඳහා මොනරාගල ප්‍රදේශයේ යෙදෙන ප්‍රාදේශීය ව්‍යවහාර පිළිවෙලින් නම් කරන්න.
(අ) ---------------------------- (ආ) ----------------------------

x. "අතු කපා මොර කන්නා සේ
ප්‍රස්තාව පිරුලේ අදහස ලියන්න.

(ලකුණු 2 ×10 = 20)

Remove Watermark Now

02. පහත දැක්වෙන අ.ආ.ඉ.ඊ.යන විස්තර අතුරින් එකක් තෝරා ගෙන වචන 250 ට නොඅඩු රචනාවක් ලියන්න. සුදුසු සුදුසු මාතෘකාවක්ද යොදන්න.

(අ) සෑම මනුෂ්‍යයෙකුටම ස්වකීය ජන්ම භූමිය පිළිබඳව ඇත්තේ අභිමානයකි. දේශයේ ඉතිහාසය, ස්වභාව සෞන්දර්ය සංස්කෘතික උරුමයන් ඇරුණු කොට නිදහස් නිවහල් පුද්ගලයන්ගේ ක්‍රියාකාරකම් මත දේශාභිමානය ජනනය වේ. දේශාභිමානය රට වැසියා තුළ ජනිත කරවීම මුඛ්‍යාර්ථය කරගත් දේශීය ගීත කලාවක් අප සතුවීම ආඩම්බරයට කරුණකි.

(ආ) අනාදිමත් කාලයක සිට පැවත එන දේශීය වෛද්‍ය ක්‍රමය අප රටේ වැඩි දෙනෙකුට බොහෝ පිහිට වන්නකි. කැඩුම් බිඳුම් අංගභාග, බොහෝ නිදන්ගත රෝග පිළිබඳව දේශීය වෛද්‍ය ක්‍රමය සතු විශ්වාසය ලොව පුරා ප්‍රචලිත වී ඇති ආකාරය ඇදහිය නොහැකි තරම්ය.

(ඉ) විද්‍යාව හා තාක්ෂණය අද වන විට ඉතාමත් දියුණු තත්ත්වයේ සිටී. එය මිනිසාට සෑජු බලපෑම් ඇති කළ ද මිනිසා නවීන විද්‍යාවේ හිණි පෙත්තට නැග සිටී. ලොව දරුණුතම රෝගබාධ සඳහා ප්‍රත්‍යක්ෂ ඖෂධ සොයා ගැනීමත් හිරෝෂිමා නාගසාකි වැනි නගරවල අදටත් අංගවිකල දරුවන් බිහි වීමත් එහිම ප්‍රතිඵල නොවන්නේද ? සමස්ත ලෝකයම සුන්දර ඉසව්වක් කරා ගෙන යාමට නවීන විද්‍යාව හා තාක්ෂණය කෙසේ දායක කර ගනිමුද?

(ඊ) අපගේ රට අතීතයේ සිට කෘෂිකාර්මික රටක් ලෙස හැඳින්වුවද සංවර්ධනයේදී කර්මාන්ත අංශයෙන් ලැබෙන්නේ සුවිශාල දායකත්වයකි. මෙහිදී සුළු පරිමාන කර්මාන්ත කැපී පෙනෙණු ඇත. රටේ ස්වයංපෝෂිත බව විරැකියාව හා සමාජීය ප්‍රශ්න රැසක් සඳහා සාර්ථක විසඳුම් ලබා ගැනීමට මහා පරිමාන කර්මාන්තයන්ගෙන් ඈත් වී ස්වයං රැකියා ගම තුළ ජනිත කළ යුතුය.

(ලකුණු 25)

03. පහත සඳහන් ඡේදය වචන 45-50 අතර වනසේ සාරාංශ කරන්න.

වන්දනා ගමන්වල යෙදීම අපගේ සංස්කෘතියේ දක්නට ලැබෙන එක් ලක්ෂණයකි. එය සාමාන්‍ය චාරිකා වලට වඩා වෙනස් ස්වරූපයක් ගනී. එම වෙනස කතාබහ ඇඳුම් කැඩුම් ආහාර පාන ආදී චර්යා සමුදායක ම දැකිය හැකිය. ශ්‍රී පාද වන්දනාවේහි දී මෙම වෙනස විශේෂයෙන්ම සිදුවනු දක්නට ලැබේ. ප්‍රථම වරට සිරිපාද වන්දනාවේ යෙදෙන්නා විශේෂ පුද්ගලයෙකු වේ. ඔහු හඳුන්වන්නේද කෝඩු යන වචනයෙනි. කෝඩු කාරයා ලාබාල අයෙකු නම් ඔහු කිරිකෝඩු යනුවෙන්ද වැඩිහිටියෙකුනම් දඩු කෝඩු යනුවෙන් ද හැඳින්වේ. කෝඩු යන වචනය කාලාන්තරයක සිට එන්නකි. අදද භාවිතා වන්නකි. අනාගතයේදී භාවිතා වනු ඇත. කණ්ඩායමේ නායකයා නඩේ ගුරු ලෙස හඳුන්වයි. ගුරා දෙන අවවාද කෝඩු කරුවන් මෙන්ම අනෙක් අයද, පිළිපැදිය යුතුය. සිරිපා වන්දනාවේ දී නඩේ බොහෝ අය ගුරාට අවනතව කටයුතු කරන්නට මැලි බවක් නොදක්වති. කෝඩු කරුවන් සිත ගඟුලෙන් නෑවීමද සිරිතක් ලෙසින්ම පවතී. දෙවියන් බුදුන් හමුවට පවිත්‍රව යාම කලාන්තරයක සිට අපට ඇබ්බැහි වී ඇති ලක්‍ෂණයකි. මෙහිදී මතු වී පෙනෙනුයේ ද එම ලක්ෂණයම වෙයි. නාන්නට බැරිකමක් ඇති වන්දනා කරුවන් වුවද සීත ගඟුලෙන් මුහුණ අත් පා සෝදා පිරිසිදු විය යුතුව ඇත.

(ලකුණු 10)

04. පහත සඳහන් කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නිම් නැති දිවි බර උසුලා - සිරුර නැමී වකුටු වෙලා
කාලය ගිය ගමන්මගේ - පා සටහන් මුහුණ පුරා
ජීවිතයේ පොත කියවා - පැන විසඳා සුදුවුන හිස
ලොව අක්මුල් සොයා යමින් - මහ පොළොවට නැඹුරු වෙලා
මළහිරු බසිනා ඇදිරියෙ - කතා කියයි මුනුබුරන්ට
උතුරු සළුවෙ සුදෙන් වැසී - පන්සල් යයි පෝයදාට
මෙතුවක් නොඇසූ නොදුටු - විකුම් ලොවෙහි සිදු වෙද්දී
අසිත තවුස්පාණන් සේ - පිබිදෙයි වත මැළවෙයි යළි
බිම හෙලන්න අකමැති සේ - බුලත් හපය මුවේ රුවා
පිරිත් පොතට නෙත යොමමින් - නවගුණ වැල ගණින් කරයි.



pastpapers.lk
pdfelement

i. මුනුබුරන්ට කතා කියා දෙන මෙහි සඳහන් පුද්ගලයා කවුරුන් විය හැකිද?

ii. මෙහි සඳහන් පරිදි ඔහුගේ සිරුර නැමී වකුටු වී ඇත්තේ කුමක් නිසාද ?

iii. මෙහි සඳහන් පුද්ගලයාට උපමා කර ඇත්තේ කාටද ?

iv. පහත සඳහන් පද සඳහා සුදුසු සමාන පද කවි පන්තියෙන් සොයා ලියන්න.
   අ) නිමාවක් නැති
   ආ) අඳුරේ

v. මෙහි සඳහන් පුද්ගලයා ජීවිතයේ බොහෝ අත්දැකීම් ලද පුද්ගලයෙකි. ඒ බව දැක්වෙන කවි පදය උපුටා ලියන්න.

(ලකුණු 2 × 5 = 10)

05. පැරකුම් පුර 'සමගි' ක්‍රීඩා සමාජයේ සභාපති වන නිමල්සිරි බණ්ඩාර ඔබ යැයි සිතා ඔබ ක්‍රීඩා සමාජයට අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ කට්ටලයක් ලබාගැනීමට අදාල බලධාරියාට යවන ලිපිය සකස් කරන්න. භාණ්ඩ කට්ටලයේ ස්වභාවය එහි අවශ්‍යතාව හා කාලවකවානුව, ප්‍රයෝජන පිළිබඳ සඳහන් කරන්න.

(වචන 125ක් පමණ)

හෝ

පහත දී ඇති ප්‍රවෘත්තිය ඇසුරින් පුවත්පතක් සඳහා විශේෂාංග ලිපියක් ලියන්න.

"දේශීය වෛද්‍ය ක්‍රමය මගින් මාරාන්තික රෝගයක් සඳහා ප්‍රත්‍යක්ෂ ඖෂධයක් සොයාගැනීම"

(වචන 125ක් පමණ)

(ලකුණු 15)

papers.lk
pdfelement
Remove Watermark Now

Remove Watermark Now
papers.lk
pdfelement

සියලුම හිමිකම් ඇවිරිණි
All Righis Reserved

# කැලණිය අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය 2016

## 10 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

නම/විෂය අංකය ------------------------------------------------------------------------------------------------ කාලය පැය 2

නියමිත ලකුණු ප්‍රමාණය 80 කි.

01. i-x තෙක් සියලුම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. (අ) උම්මග්ග ජාතකය රචනා කිරීමේ අරමුණ වී ඇත්තේ කුමක් ද?
(ආ) ජාතක කතා පොත රචනාකර ඇත්තේ කිනම් රජු දවස ද?

ii. (අ) බැද්දේගම නවකතාවේ කතුවරයා නම් කරන්න.
(ආ) එහි පරිවර්ථකයාගේ වෙනත් පරිවර්ථන කෘතියක් නම් කරන්න.

iii. (අ) ගුත්තිල කාව්‍යයේ රචකයාගේ නම කුමක්ද?
(ආ) ඒ සඳහා ආරාධනා ලැබුවේ කාගෙන් ද?

iv. (අ) මුනි සිරිපා සිඹිමින්නේ පාඩමට පාදක වූ දීර්ඝ කාව්‍ය පන්තිය කුමක්ද?
(ආ) එහි කතුවරයා නම් කරන්න.

v. පහත සඳහන් ජාතක කතා ඇසුරින් සම්පාදිත ගී කාව්‍ය නම් කරන්න.
(අ) සසජාතකය
(ආ) කුස ජාතකය

vi. නහින දෙහින කාලෙට පින් කෙරුම ……… යුත
වහින කලට කුරින් විල් වලින් ……… එත
(අ) ඉහත කවිය සම්පූර්ණ කරන්න.
(ආ) ඉන් දෙන උපදේශය කුමක් ද?

vii. "මං අහපු ආරංචියක් නැහැ කාගෙන්ද ආරංචි අහන්නේ?
(අ) මෙසේ පිළිතුරු දෙන්නේ කවුද?
(ආ) මෙහි සඳහන් ආරංචිය කුමක් ද?

viii. (අ) උම්මග්ග ජාතකයේ එන ප්‍රධාන චරිත දෙක නම් කරන්න.
(ආ) ජාතක කතා පොත ලිවීමට මූලාශ්‍රවූ ග්‍රන්ථය නම් කරන්න.

ix. "නොබව මැනව දේවයන් වහන්ස. රාජ්‍ය සුව අනුභව කළ මැනව. මම කැටක් ගෙන කපුටු රැසක් පලවන එකක් භූ මෙන්"
(අ) මෙසේ පවසන්නේ කාටද ?
(ආ) මෙසේ පවසන්නේ කවුද?

x. "නිරිත දිග තද සුළඟට ඇඹරවී ඇටුවන් බැහී ගිය ගහක් මෙන් ඇගේ ශරීරය ද නැමී ඇඹරී තිබිණ"
(අ) මෙහි සඳහන් උපමාව තෝරා ලියන්න.
(ආ) ඇය යනුවෙන් සඳහන් තැනැත්තියගේ නම කුමක්ද?

(ලකුණු 2 × 10 = 20 යි)

Remove Watermark Now

02. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. ''මඟුල් උයන **නඳුන් උයනක්** සේ සරසා දහස් ගණන් කුඩාරම්වල රා පුරා තබ්බා අනේක ප්‍රකාර මසවුළු ඒ ඒ ස්ථානයෙහි වළන් පුරා රැස් කොට තබවයි අමාත්‍යයන්ට **විධාන කළහ.**

(අ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ආ) අංකිත පදවල අර්ථය ලියන්න.

ii. සතොස් කරන වීණා නද ඇසුමට
නොගොස් සිටින <u>පිල්බර ගණ</u> ගොදුරට
<u>වෙසෙස් රුවන්</u> තම මැවුවත් බඹනට
සඳැස් සවන් නොකළැයි වූ නොසතුට

(අ) පිල්බර ගණ නොසතුටට පත්වීමට හේතුව කුමක්ද?

(ආ) අංකිත පදවල අර්ථය ලියන්න.

iii. පුංචි මැණිකාගේ බඩගින්නට හා <u>තෙහෙට්ටුවට ද</u> මහල්ලාගේ කථාවෙන් උපන් <u>සන්තාපයක්</u> දුකක් එකතුවිය. ඈ නිසොල්මනේ වැලපෙන්නට වූවාය.

(අ) මෙය කුමණ අවස්ථාවක් හා සබැඳේද?

(ආ) අංකිත පදවල අර්ථය ලියන්න.

iv. කරදර දහසක් හමු වී
ඉන්ටැකි නම් සිනාවේවී
ඔහු මෙලොවට පහළ දෙවී
රජෙකැයි සලකනු මැනවි

(අ) මෙහි සඳහන් පරිදි දෙවි රජ වීමට කුමක් කළ යුතුද?

(ආ) මෙම පද්‍ය ඇතුළත් ග්‍රන්ථ කර්තෘගේ වෙනත් නිර්මාණයක් නම් කරන්න.

v. අපගේ මෙබදු මන්ත්‍රණයට බාධා කළා වූ <u>පසමිතුරා</u> ගනුම්හ, එක් සියක් රජදරුවන් හා අටලොස් අක්ෂෞහිණියක් පමණ සේනාව හා පිරිවරාඒ මියුලු නුවරට යම්හ. අපහා <u>කැටිව එව,</u> ආචාරිණි '' යි කිහ.

(අ) මෙම පාඨයට සම්බන්ධ වූ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ආ) අංකිත පදවල අර්ථය ලියන්න.?

(ලකුණු 4 × 5 = 20 යි)

- 3.4 ප්‍රශ්න සඳහා වන උත්තරයක වචන 150-200 අතර තිබීම ප්‍රමාණවත්ය.

03. ''උම්මග්ග ජාතකයේ සාර්ථකත්වයට කතුවරයාගේ.

i. සුදුසු උපමා භාවිතය

ii. සංවාද මිශ්‍ර භාෂාව හේතු වි ඇත.

නිදසුන් දෙක බැගින් දෙමින් විමසන්න.

නැතහොත්

ජන කවියේ දැකිය හැකි සුවිශේෂි ලක්ෂණ වූ,

i. සරල බස් වහර

ii. උපදේශාත්මක බව

නියමිත පාඩමෙන් නිදසුන් දෙක බැගින් දෙමින් විමසන්න.

(ලකුණු 15)

papers.lk
pdfelement

04. ගුත්තිල ඇදුරු තුමාගේ වීනා වාදනයේ මිහිරි බව පැවසීමට කවියා ,

i. සත්ත්ව සමූහයා

ii. දෙව් මිනිස් සමූහයා

රැස් වූ ස්වභාවය අපූරු ලෙස වර්ණනා කර ඇත. නිදසුන් දෙක බැගින් දෙමින් පහදන්න.

නැතහොත්

"පාඨක සිත් සතන් දයානුකම්පාවෙන් පුරවාලමින්

i. අවස්ථා හා සිද්ධි ගැලපීම

ii. දෙබස් භාවිතය

කතුවරයාගේ ප්‍රතිභාව ඉස්මතු කරවයි. " බැද්දේගම නවකථාවේ නියමිත කොටසින් නිදසුන් දෙක බැගින් දෙමින් විමසන්න.

(ලකුණු 15)

- 5,6,7 ප්‍රශ්න වලින් එකකට පමණක් උත්තරය ලියන්න. උත්තරයට වචන 100 ක් පමණ සෑහේ

05. කෝච්චිට බමුණාගේ චරිතය හාස්‍යයට ලක්වී ඇති අවස්ථා 03 ක් නිදසුන් දෙමින් විමසන්න. (ලකුණු 10 යි)

06. "මුණි සිරිපා සිඹිමින්නේ කාව්‍ය නිර්මාණය සාර්ථක කර ගැනීමට කවියා යොදා ගෙන ඇති කාව්‍ය උපක්‍රම 03 ක් නිදසුන් දෙමින් පෙන්වා දෙන්න.

(ලකුණු 10 යි)

07. යහපත් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය ආදර්ශ "හානා හීය පානා අඬහැරෙන් දැනේ." පාඩම ඇසුරින් නිදසුන් 03 ක් දෙමින් විමසන්න.

(ලකුණු 10යි)

papers.lk pdfelement

Remove Watermark Now
papers.lk
pdfelement